# සිහිනය සැබෑ විය...

## අයි.ජී. හර්ෂණී සමුද්‍රිකා තෙන්නකෝන්

සිහින කියන්නේ හරි ලස්සන දෙයක්. ජීවිතයට බලාපොරොත්තු ඇති කරන්නේ ඒ සිහින කියලා මට හිතෙනවා. මට නම් ජීවිතයම සිහිනයක් වගේ. අද මං පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා විශේෂවේදී උපාධිධාරිනියක්. 2018.06.05 දින උපකුලපති තුමා අතින් මගේ උපාධිය පිරිනැමෙන අවස්ථාව දරා ගන්න බැරි තරම් සතුටක් දැනුනා. මේ තමා මං දැක්ක ලොකුම සිහිනය. මං වගේම මගේ අම්මාත්. අම්මා ජීවිතයේ විඳපු දුක් කවදාවත් මට වචන වලින් කියලා නිම කරන්න බැහැ. අද මං ලැබූ ජයග්‍රහනය මගේත් අම්මාගෙත් විතරක් නෙවෙයි.



උසස් පෙළ ප්‍රතිඵල නිසා මට ලැබුණ සතුට මං ළඟ රැදුනේ නිමේෂයක් පමණයි. මගේ ඒ සිහිනය ඉදිරියට ගෙනියන්න මගේ අම්මාට බැරි බව මට තේරුම්ගන්න සිද්ද වුණා. මං ගාමන්ට් එකක වැඩට ගියේ කැම්පස් යන්න සල්ලි කොහොම හරි හොයාගන්නවා කියලා දැඩි අරමුණකින්.



ඒත් මම හිතුව තරම් ඒක පහසු දෙයක් වුණේ නැහැ. ඒ සුළු මුදල විශ්වවිද්‍යාල ප්‍රවේශයට කොහොමටත් ප්‍රමාණවත් වුණේ නෑ. උසස් පෙළ ප්‍රතිඵල එද්දී අම්මාට තිබුණ එකම වත්කම අපේ කුඹුර. අම්මා ඒකත් උකස් තියලා මට සල්ලි හොයලා



දුන්නා සරසවියට යන්න. ඒත් ඒ රුපියල් 25000 අවුරුද්දකටවත් ප්‍රමාණවත් වුණේ නෑ. ඉතින් මං දැකපු හීන බොඳ වෙලා යන්න පටන් ගත්තා. ඒත් අදිසි හස්තයක් වගේ ඒ මොහොතේ සන්නස පුවත්පත මගේ ගැළවුම්කාරයා වුණා. මං ඉදිරියේ බොඳවෙන හීන නැවත මගේ ඉදිරියට ගෙනත් දුන්නේ සන්නස පුවත්පත. ඉතින් ආදරණීය ඒ මනුෂ්‍යත්වය මං කොහොම අමතක කරන්නද? සන්නස කර්තෘ ජගත් ජේ. එදිරිසිංහ සර්, මගේ පළමු ආචාරය ඔබටයි.

සන්නස පුවත්පතේ මා පිළිබඳව සටහන් කිරීම නිසා ඕස්ට්‍රේලියාවේ සිටින ශ්‍රී ලාංකික මනුෂ්‍යත්වය මට පිහිටක් වුණේ මා ඉතා අසීරු තත්වයකට මුහුණ දෙමින් සිටි අවස්ථාවේදීයි. ඇත්තෙන්ම මා නොදැක මට පිහිට වු ඒ මිනිසුන් නොවන්නට මා අද මේ සිහිනය අභියසවත් නැත. ඉතින් මා බලන්නට පැමිණ තොරතුරු විමසා මට පිහිට වූ ශ්‍රියානි පද්මපෙරුම මහත්මිය, දුරකථනයෙන් මා සම්බන්ධ කරගනිමින් නිතර සුව දුක් විමසමින් මට මාගේ ඥාති යෙකු සේ පිහට වු ආදරණීය කාංචනා මැඩම් සහ දීපාල් සර් , පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඕස්ට්‍රේලියානු ආදී විද්‍යාර්ථීන්ගේ සංගමය හරහා මට ආධාර ලබා දුන් චක්‍රා විජේසුන්දර සර්, ගාමිණී සර් සහ ගුණතිලක සර් ඇතුළුව මට විවිධාකාරයෙන් සහය වූ සියලු දෙනාටම මා හිස නමා ආචාර කරනවා. අද මා සිහිනය අභියසට රැගෙන ආවේ ඔබ සියලු දෙනාගේ මනුෂ්‍යත්වයෙන්ම මිස අන් කිසිදෙයකින් නොවන බවත් මා දන්නවා.

මා ජයග්‍රහනයේ කිරුළ පැළඳි බවත් ඒ සියල්ල ඔබ නිසා වෙන් බවත් ජීවිතයේ කිසි දිනෙක අමතක නොකරමි. මා වැනි දුප්පත් අසරණ අයට ඔබගේ දෑත් දිගුවීම පෙර කළ වාසනාවක් සේ මා සළකමි. ඉතින් සිහිනය හඹා ගොස් අවසන මා ඒ ජයග්‍රහනය ලබාගත්තෙමි. ඉදිරියටත් මෙවැනි සත්කාර්යයන් කිරීමට ජගත් ජේ. එදිරිසිංහ සර් ඇතුළු ඔබ සියලු දෙනාටම ශක්තිය ධෛර්‍ය ලැබේවා කියා පතමි. ඉතින් මේ සිහිනයට මා කැඳවාගෙන ගිය ජීවිතය දිනන්නට මට පාර කියා දුන් නම් වශයෙන් සඳහන් කළ නොකළ ඔබ සියලු දෙනාටම නැවත නැවතත් බොහෝ පිං සිදුවේවා යැයි ප්‍රාර්ථනා කරමි.




## මහින්ද ගුණවර්ධන.

**නිලමෙලා හැමවෙලේ ම අන්දරේ අන්දන්න හැදුවා. ඒත් අන්දරේ නිල මෙලා අපහසුතාවට පත් කළා පහසුවෙන් ම.**

දවසක් අන්දරේ කොටු කරගත් නිලමෙලා

"තෝ මඟුල් පොකුණෙන් වතුර බොන්න ගිහින් බෙල්ල කපා ගන්නෙ නැතුව ගෙදර ළිඳෙන් වතුර බීපිය" කියලා රජතුමා අන්දරේට අනතුරු අඟවපු සිද්ධිය මුල් කරගෙන විහිළු කරන්නට පටන් ගත්තා. අන්දරේ අහගෙන හිටියා. මේ වෙලාවේ අන්දරේට කල්පනා වුණා අපූරු අදහසක්.

"මට ඕන නම් මහ බිසවගෙ ඇඳුමක් වුණත් අඳින්න පුළුවන්." අන්දරේ කිව්වා.

"උතුරු සළුවවත් අල්ලන්න පුළුවන් වෙයි කියල යි බය." නිලමෙ කෙනෙක් කිව්වා.

"මොකෝ බැරි. අල්ලලා විතරක් නෙවෙයි මහ බිසවගෙ උතුරු සළුව අඳින්නත් මට පුළුවන්."

"ඒකත් මඟුල් පොකුණෙන් වතුර බොන්න හැදුව වගේ වේවි."

නිලමෙලා හැම දෙනා ම මහ හඬින් හිනා වෙන්න පටන් ගත්තා.

"හොඳයි. මං ළඟදීම පෙන්නනම්කො." අන්දරේ පිළිතුරු දුන්නා.

වැඩි දවසක් ගියේ නෑ. වැව බලන්න ගිය අවස්ථාවක රජ බිසවට ආස හිතුණා වැවේ ඔරුවකින් යන්න.

කව්ද මේ වැඩේට අල්ලගන්නෙ? බිසව කල්පනා කළා.

"බිසවුන් වහන්ස. අන්දරේ එක්ක ඔරු පැද් දොත් කිසි වෙහෙසක් නැතුව වැව වටේ ම ගිහින් එන්න පුළුවන් වෙයි. අන්දරේ ටිකක් අවුස්සන්න විතරනෙ තියෙන්නෙ." පරිවාර සේවිකාවක් යෝජනා කළා.

ඊළඟ දවසේ වැවේ ඔරු පදින්න තීරණය වුණා. තොටියා අමුඩය පමණක් ඇඳගෙන හබල අතට ගත්තා. රජ බිසව ඔරුවට නැගලා වටපිට බලමින් විනෝද වෙනවා. නිලමේවරු වැව් ඉවුරට වෙලා බලා සිටිනවා.

ටික දුරක් යද්දි ඔරුව යටින් වතුර විදිනවා. බිසව ඒක දැක්කා. බය වෙලා කෑ ගැසුවා.

"බිසවුන් වහන්ස, බය වෙන්න නරකයි. ඔරුවේ සිදුරක්. මං ඒක වහන්නම්. එතකොට ඔරුවට වතුර උනන්නෙ නෑ"

අන්දරේ අමුඩෙ ගැලෙව්වා. කොනකින් ඇබයක් හදලා සිදුර වැහුවා. රජ බිසව ඇස් වසා ගත්තා. "දෙවියනේ, අන්දරේ හෙළුවෙන්."

දැන් කරන්න දෙයක් නෑ. මේ විදියට ඔරුවේ යන්න බෑ. බිසව අහක බලාගෙන උතුරු සළුව අන්දරේ දෙසට විසි කළා. අන්දරේ උතුරු සළුව ඇඳගත්තා.

ඔරුවෙ සිදුරක් හදලා ඒකට ඇබයක් ගහලා කලින්ම සකස් කර තිබුණොත් අන්දරේ ම තමයි.

**නිලමෙලා පල්වුණා.**




## මහින්ද ගුණවර්ධන

## වැඩ සහ ආහාර

ගමක ජීවත් වූ බෙහෙවින් රූමත් තරුණියක් ගැබ්ගත්තා. කෝපයට පත් ඇගේ දෙමව්පියන් දරුවාගේ පියා කව්දැයි විමසුවා. මුල දී පිළිතුරු දීමට මැළි වූ ඇය සියල්ලන්ගේ ම ආදරයට සහ ගෞරවයට පාත්‍ර ව සිටි සෙන් ගුරුවරයකු වූ හකුයින් නම් කළා. ගැබිණියගේ දෙමාපියන් හකුයින් ගුරුවරයා මුණ ගැසෙන්නට ගොස් ඔහුට චෝදනා කළා.

"හැබෑට ?" හකුයින් ප්‍රතිචාර දැක්වුවා.

ප්‍රසූතියෙන් පසු ළදරුවා රැගෙන හකුයින් මුණ ගැසීමට ගිය යෞවනියගේ දෙමාපියන් ඔහුට දරුවාගේ භාරකාරත්වය පැවරිය යුතු බව ප්‍රකාශ කළා.

"හැබෑට ?" හකුයින් නැවතත් කිව්වා.

සෙන් ගුරුවරයා පිළිබඳ ව තිබුණු යහපත් චිත්‍රය අතුරුදහන් වුණා. ගමේ සියලු දෙනා ම ඔහු ගැන කථා කළේ පිළිකුළෙන්. එහෙත් ගුරුවරයා දරුවා සෙනෙහසින් ඇති දැඩි කළා.
මාස ගණනාවක් ගත වුණා. ළදරුවාගේ මවට තවදුරටත් සත්‍ය වසන් කරගෙන සිටීමට බැරි තත්ත්වයක් උදා වුණා. ඇය දරුවාගේ සැබෑ පියා ගැන හෙළිදරව් කළා. ඔහු ගමේ ම සිටි තරුණයෙක්. රූමතියගේ දෙමාපියන් නැවතත් හකුයින් මුණ ගැසෙන්නට ගියා.

"අපට සමාවෙන්න ගුරුතුමනි. දරුවාගේ පියා අසුවලා බව අපි දැන ගත්තා."

"හැබෑට ?" හකුයින් නැවතත් පැවසුවා. සෙන් ගුරුවරයා නැවතත් දරුවා බාර දුන්නා.

